230

# ක්‍රි.ව. 1850 සිට 1950 දක්වා කුරුණෑගල දිස්ත්‍රික්කයේ රජයේ පාසල් ව්‍යාප්තවීම පිළිබඳ විස්තරාත්මක අධ්‍යයනයක්

**කැළණිය විශ්ව විද්‍යාලයයේ සමාජීය විද්‍යාපති පාඨමාලාව - 1998**


ශිෂ්‍ය ලියාපදිංචි අංකය :- HIST/R/54/98

**එම්.එම්.එන්.ඩී.බණ්ඩාර**


කැළණිය විශ්ව විද්‍යාලයයේ සමාජීය විද්‍යාපති උපාධි පරීක්ෂණයේ අවශ්‍යතාවය
සම්පූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කෙරෙන
පර්යේෂණයේ නිබන්ධනයකි.

# හැඳින්වීම.

කන්ද උඩරට රාජ්‍ය 1815 දී බ්‍රිතාන්‍යන්ට යටත්වීමත් සමඟ සත්කෝරළය ද බ්‍රිතාන්‍ය පරිපාලනයට යටත් විය. උඩරට රජයේ ඉතා වැදගත් ප්‍රදේශයක් වූ සත්කෝරළය බ්‍රිතාන්‍යට යටත් වූ පසු මුලින් බස්නාහිර පළාත යටතේ පාලනය වුව ද, පසුව වයඹ පළාත වශයෙන් වෙන ම පරිපාලන ඒකකයක් බවට පත්විය.

ශත වර්ෂ 03 ක පමණ කාලයක් පෘතුග්‍රීසි, ලන්දේසි පාලනයට යටත්ව තිබූ හලාවත, පුත්තලම ප්‍රදේශ මෙන් ම මෑතදී බ්‍රිතාන්‍ය පාලනයට අයත් වූ සත්කෝරළය ද වයඹ පළාතට අයත් විය. සත්කෝරළයේ පැවැත්ම, ජන ජීවිතය හා ආර්ථිකය, පළාතේ මුහුදුබඩ ප්‍රදේශවලට වඩා බොහෝ වෙනස් ස්වරූපයක් ගත්තේ ය. බුද්ධාගම තවදුරටත් එහි සුරක්ෂිත වී තිබූ අතර, ක්‍රිස්තියානි ආගමික බලපෑම ද ඉතා අඩු මට්ටමක පැවතිණි. ආර්ථිකය ද බොහෝ දුරට කෘෂිකර්මය මත පදනම් විය. පරිපාලන පහසුව උදෙසා 1845 දී කුරුණෑගල වෙන ම පරිපාලන දිස්ත්‍රික්කයක් ලෙස ස්ථාපිත කරන ලදී. මෙම වකවානුවේ සිට ලංකාව බ්‍රිතාන්‍ය පාලනයෙන් නිදහස ලැබෙන තෙක් ගත වූ වර්ෂ 100 තුළ කුරුණෑගල දිස්ත්‍රික්කයේ රජයේ පාසල් ව්‍යාප්ත වූ අයුරු අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ.

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ඉතිහාසය ගැන බොහෝ උගතුන් පර්යේෂණ කර ඇත. විස්තර වාර්තා ප්‍රකාශයට පත්කර ඇත. මේ අතර මහාචාර්ය ජේ.ඊ. ජයසූරිය, ආචාර්ය රංජිත් රුබේරු කේ.එම්.එම්. සුමතිපාල, එල්.ජේ. ග්‍රේෂන්, යන අය කැපී පෙනෙන කාර්ය භාරයක් ඉටු කර ඇත. ඔවුන්ගේ පර්යේෂණවලදී ලංකාවේ අධ්‍යාපන ඉතිහාසය පිළිබඳව සවිස්තර අධ්‍යයනයක් කර ඇත. නමුත් වයඹ පළාතේ කොටසක් වන කුරුණෑගල දිස්ත්‍රික්කය වෙන ම ඒකකයක් ලෙස ගෙන කරන ලද විස්තරාත්මක අධ්‍යයනයක් ගැන තොරතුරු සොයාගත නොහැක.

මෙම පර්යේෂණයේ කාල වකවානුව 1850 - 1950 දක්වා කාලය වුව ද, 1815 වර්ෂයේ උඩරට රජය බ්‍රිතාන්‍යන්ට අයත් වූ අවස්ථාවේ සිට 1848 දක්වා අධ්‍යාපනයේ පැවති සංවර්ධනය ගැන දළ විමර්ශණයක් ඉදිරිපත් කරන ලද්දේ, ඒ ගැන අවශ්‍ය පසුබිම සකස් කර ගැනීම පිණිස ය.

එසේ ම, පර්යේෂණය, රජයේ පාසල් ව්‍යාප්තිය පිළිබඳ වුව ද, ආගමික නිකායයන් මගින් ආරම්භ කරන ලද පාසල් ගැන ද අවධානය යොමු කරන ලද්දේ රජය මගින් පාසල් ආරම්භ කිරීමේදී ආගමික නිකායයන් මගින් ඒ වන විට පාසල් ආරම්භ කර තිබූ ප්‍රදේශ වලට අඩු ප්‍රමුඛතාවක් දැක්වීමේ ප්‍රතිපත්තියක් තිබූ බැවිනි. පර්යේෂණයේ අරමුණු කරා ළඟාවීම පහසු වනු පිණිස, පහත සඳහන් පරිදි මෙහි පරිච්ඡේද වෙන්කර ගන්නා ලදී.

I. බ්‍රිතාන්‍ය පාලනය ආරම්භ වීමට පෙර (කුරුණෑගල දිස්ත්‍රික්කය ගැන විශේෂ අවධානය යොමු කරමින්) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ආයතන විකාශනය වී තිබුණ අන්දම පිළිබඳ හැඳින්වීමක් ( මෙහිදී දේශිය අධ්‍යාපන ආයතන හා මිෂනාරි පාසැල් මෙන් ම, රජය මගින් ආරම්භ කරන ලද පාසැල් පිළිබඳව ද අවධානය යොමු කරනු ලැබේ.)

II. බ්‍රිතාන්‍ය පාලකයන් විසින් ශ්‍රී ලංකාව තුළ සාමාන්‍ය අධ්‍යාපනය ප්‍රචලිත කිරීම සඳහා යොදන ලද සැලසුම් පිළිබඳ අධ්‍යයනයක්.

III. ජාතික අධ්‍යාපන සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ රජයේ පාසල් ආරම්භ කිරීම හා ව්‍යාප්තිය පිළිබඳ විස්තරාත්මක අධ්‍යයනයක්

IV. කුරුණෑගල දිස්ත්‍රික්කයේ රජයේ පාසල් ස්ථානගතවීම කෙරේ බලපෑ සමාජමය හා ඓතිහාසික සාධක

V. පාසල් පරිපාලනය සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වූ පරිපාලන ව්‍යුහය.

පළමු පරිච්ඡේදය තුළින් විස්තර කිරීමට උත්සාහ දරා ඇත්තේ, බටහිර ආරක අධ්‍යාපනය කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ව්‍යාප්ත වීමට පෙර මෙම ප්‍රදේශයේ පැවති දේශීය අධ්‍යාපන ක්‍රමයයි. දේශීය අධ්‍යාපනයේ ප්‍රධාන ස්ථානයක් බෞද්ධ විහාරස්ථානයට හිමි විය. මෙම පන්සල් හා ඒ ආශ්‍රිත පාසල්වල පැවැත්ම සඳහා ස්වදේශීය රජුන් විශාල වශයෙන් ඉඩකඩම් පරිත්‍යාග කර තිබිණි. විශේෂ අනුග්‍රහ දක්වා තිබිණි; මෙම ආගමික ආයතන වල ස්ථාවරත්වය හා ශක්තිය පෙන්නුම් කරන්නේ, බ්‍රිතාන්‍යයන් උඩරට අල්ලාගත් පසු ඒ සඳහා දැක්වූ අනුග්‍රහය සම්පූර්ණයෙන් නවතා දැමුවත්, එම ආයතන ක්‍රියාකාරීත්වයේ පැවතීම යි. ක්‍රි.ව.1895 වන විට ද කිසි ම රාජ්‍ය අනුග්‍රහයක් නොමැතිව මෙම පන්සල් හා ඒ ආශ්‍රිත පාසල් පවත්වා ගෙන ගොස් ඇත.

1875 දී ප්‍රසිද්ධ ඉගැන්වීම් අධ්‍යක්‍ෂවරයාගේ පාලන වාර්තාවේ මෙසේ සඳහන් කර ඇත.

> 'දැනට උඩරට දරුවන්ට අධ්‍යාපනය ලබා දීමට ඇති ප්‍රධාන අපහසුව පාසල් සඳහා ගොඩනැගිලි හිඟ වීම සහ අනෙකුත් මූලික පහසුකම්වල අඩුපාඩුවයි. මෙම ගැටලුව පන්සල් පාසල් මනාව සංවිධානය කිරීමෙන් විසඳාගත හැක. '

මෙයින් පැහැදිලි වන්නේ 1875 වන විට ද පන්සල් පාසල් පදනම ශක්තිමත්ව පැවති බව ය. විශේෂයෙන් මෙකල ගමක අධ්‍යාපන කටයුතු සඳහා යොදා ගත හැකි ගොඩනැගිලි ඉඩකඩ පහසුකම් තිබු නේ ගමේ විහාරස්ථානයේ පමණි. නූතන අධ්‍යාපන ව්‍යාප්තියේ පදනම සඳහා මෙය යොදා ගැනීමට තිබූ ඉඩකඩ බ්‍රිතාන්‍ය පාලකයින් නොසලකා හැරීම නිසා මේ යුගයේ අධ්‍යාපනය ව්‍යාප්ත කිරීමට තිබූ පහසු ම මාර්ගය අවහිර විය. මෙම තත්වය විස්තර කිරීමට පළමු පරිච්ඡේදය යොදා ගනු ලැබේ.

දෙවන පරිච්ඡේදයේ විස්තර කිරීමට බලාපොරොත්තු වී ඇත්තේ බ්‍රිතාන්‍යයන් මෙරට අධ්‍යාපනය ව්‍යාප්ති කිරීම සඳහා දරන ලද උත්සාහය පැහැදිලි කිරීමයි. මේ පිළිබඳව බොහෝ පොත පත ලියවී ඇති අතර, පර්යේෂණයන් ද සිදුකර ඇත. මේ නිසා එම තොරතුරු ඇසුරින් අධ්‍යාපන විකාශනය පිළිබඳ කෙටි විස්තරයක් ඉදිරිපත් කර ඇත.

තෙවන පරිච්ඡේදය සඳහා අවශ්‍ය පදනම සකසා ගැනීමට අවශ්‍ය ප්‍රමාණයට පමණක් මෙම තොරතුරු ඉදිරිපත් කර ඇත. පර්යේෂණයේ අරමුණ සඳහා තෙවන පරිච්ඡේදය ඍජුව යොමු කර ඇත. ජාතික වශයෙන් සකස් කරන අධ්‍යාපන ප්‍රතිපත්ති ප්‍රාදේශීය වශයෙන් ක්‍රියාත්මක වූ අයුරු කුරුණෑගල දිස්ත්‍රික්කය ඇසුරින් සොයා බැලීම මෙහි අරමුණයි. ශ්‍රී ලංකාවේ මුහුදු බඩ පළාත් ශත වර්ෂ 03 ක් පමණ විදේශීයකන්ට අයත්ව තිබුණ නිසා එහි බටහිර ආරක අධ්‍යාපනය යම් තරමක මුල් බැස ගැනීමක් සිදු වී තිබිණි. ඒ නිසා ම, බ්‍රිතාන්‍යයන් මුලදී ලන්දේසීන් ආරම්භ කළ පැරිෂ් පාසල් නොසලකා හැරියත් පසු කාලයකදී ඒ පාසල් නැවත ඇති කිරීමට ක්‍රියාකර ඇත. ඒ මත පදනම් වූ මුහුදුබඩ ප්‍රදේශවල නූතන බටහිර සම්ප්‍රදායේ පාසල්වල සීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරයි. නමුත් වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කය මේ පිළිබඳව පෙන්වන්නේ අඩු වර්ධනයකි.

පාසල් කොමිෂම හා මධ්‍ය පාසල් කොමිෂම ක්‍රියාත්මක වූ වර්ෂ 38 ක පමණ කාලය තුළ (1832 - 1870) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ආරම්භ කර ඇත්තේ රජයේ පාසල් 02 ක් පමණ ය. ඒ කුරුණෑගල ඉංග්‍රීසි පිරිමි පාසල හා ඉංග්‍රීසි ගැහැනු පාසල යි. එසේ ම, මෙම පාසල් වල ශිෂ්‍ය සංඛ්‍යාවේ වර්ධනය ද වර්ෂ ගණනාවක් යන තුරු දක්නට නොලැබේ.

උඩරට ප්‍රදේශ අල්ලා ගැනීමත් සමඟ මිෂනාරී සමාගම් මහනුවර මධ්‍යස්ථානය කරගෙන උඩරට ධර්ම ප්‍රචාරක කටයුතු ආරම්භ කරන ලදි. ක්‍රි.ව.1824 සිට කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ මිෂනාරීන් ගැවසුණත් 1864 වන තුරු විධිමත්ව ඔවුන්ගේ පාසලක් ආරම්භ කර නැත. ප්‍රථම පාසල ආරම්භ කර ඇත්තේ කුරුණෑගල නගරයේ නොව නගරයට සැතපුම් 06 ක් දුරින් පිහිටි තලම්පිටිය ගම්මානයේ දී ය. උඩරට රාජ්‍යයේ පරිපාලනය ස්ථාවර කර ගන්නා තුරු ආගම් ප්‍රචාරය හා පාසල් ආරම්භ කිරීම වැසියන්ගේ කැමැත්තෙන් තොරව නොකළ යුතු බවට ආණ්ඩුකාරවරයා 1820 දී කරන ලද නියෝගය මේ තරම් කාලයක් බලපැවැත්වූ නිසා, මෙම වර්ධනය සිදු නොවූවා නොවේ. ඊට වෙනස් විවිධ හේතූන් බලපාන්නට ඇතැයි විශ්වාස කළ හැක. ඒ අතර ශත වර්ෂ ගණනාවක් මුල් බැසගෙන තිබූ දේශීය අධ්‍යාපනයේ ශක්තිමත් පදනම එක් හේතුවකි. දෙවන කරුණ විය හැක්කේ, බටහිර සම්ප්‍රදායේ පාසල් වලින් අධ්‍යාපනය ලැබීමට ගාස්තු ගෙවීමට සිදුවීමයි.

තෙවැනි හේතුව ලෙස, බටහිර සම්ප්‍රදායේ අධ්‍යාපනයෙන් ලැබෙන ප්‍රයෝජන කුරුණෑගල දිස්ත්‍රිකයේ ජනතාව තහවුරු වී නොතිබීම විය හැක. ජනතාවගේ ජීවන පැවැත්මට මෙම අධ්‍යාපනය ඍජුව හෝ වක්‍රව අදාළ නොවිය. බටහිර සම්ප්‍රදායේ අධ්‍යාපනය තම ජීවන වෘත්තියට හෝ නව රැකියා සොයාගැනීමට හෝ හේතුවන බව ජනතාවට තහවුරු වී නොතිබිණි.

එසේ ම, අධ්‍යාපනය තුළින් ආගම ප්‍රචාරය කිරීමේ මිෂනාරී අරමුණ ද මේ වන විට දුර්වල වී තිබිණ. කොල්බෲක් කොමිෂම සිය යෝජනා ඉදිරිපත් කළ වකවානුවේ මිෂනාරී පාසල් තිබූ ස්ථානවල රජයේ පාසල් ආරම්භ නොකළ යුතු බවට කර ඇති නිර්දේශය ක්‍රියාත්මක වීම මුල් යුගයේ රජයේ පාසල් ආරම්භ කිරීමට බලපෑමක් ඇති කරන ලදි. නමුත් කුරුණෑගල දිස්ත්‍රික්කයේ මිෂනාරී පාසල් නොතිබුණ නිසා රජයේ පාසල් දිස්ත්‍රික්කය තුළ ආරම්භ කිරීමට එම නියෝගය බලපෑමට හැකියාවක් නොවිය.

ක්‍රි.ව. 1870 න් පසු ක්‍රි.ව. 1900 දක්වා රජය මගින් ස්වභාෂා පාසල් ආරම්භ කිරීමේ ප්‍රතිපත්තිය මත කුරුණෑගල දිස්ත්‍රික්කය යම් ප්‍රගතියක් ලබා ඇතත්, ඒ හා සමගාමීව මිෂනාරී පාසල්වල වර්ධනයක් නොපෙන්වයි. කුරුණෑගල නගරයට සැතපුම් 25 ක් දුරින් මහනුවර නගරය පිහිටා ඇති නිසා, එහි ඇති සියලු පහසුකම් කුරුණෑගල ඇති කිරීමට බ්‍රිතාන්‍ය පාලකයින් උනන්දු වී නැත. ඔවුන් මුහුදුබඩ ප්‍රදේශ පරිපාලනය කොළඹ පදනම් කරගෙන සිදු කළ ආකාරයෙන් ම, උඩරට ප්‍රදේශවල පරිපාලනය මහනුවර පදනම් කරගෙන සිදුකරන ලදි. මේ නිසා මහනුවර සිදු වූ අධ්‍යාපන සංවර්ධනය කුරුණෑගල සිදු නොවිය. එසේ ම, මේ වනවිට කුරුණෑගල පරිපාලන මධ්‍යස්ථානයක් ලෙස විශේෂත්වයක් දැක්වූයේ නැත. කන්ද උඩරට පරිපාලන මධ්‍යස්ථානය වීම, වතු වගාවේ කේන්ද්‍රස්ථානය වීම, හිතකර දේශගුණය, මහනුවර නගරය හා අවට ප්‍රදේශයේ අධ්‍යාපනික කටයුතු සංවර්ධනයට විශේෂ හේතූන් ලෙස බලපාන ලදි.

මෙම කරුණු සම්බන්ධව පරීක්ෂා කර කුරුණෑගල දිස්ත්‍රික්කයේ අධ්‍යාපන ව්‍යාප්තියට මුල් වූයේ රජයේ පාසල් පද්ධතිය ද මිෂනාරීන් විසින් ඇති කරන ලද පාසල් පද්ධතිය ද යන්න විමර්ශණාත්මක සොයා බැලීමත් මෙම පාසල් ස්ථානගත වීමේදී බලපෑ ඓතිහාසික සාධක සොයා බැලීමත් මෙහි තවත් අරමුණකි.

බටහිර ජාතීන් යටත් විජිත වල අධ්‍යාපනය ව්‍යාප්ත කිරීමේ එක් අරමුණක් වන්නේ සිය ආගම ප්‍රචාරය කිරීමයි. නමුත් ඒ පරමාර්ථය කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ කෙතෙක් සාර්ථක වී තිබේද යන්න මෙහිදී විමසුමට ලක් කරනු ලැබේ. එසේ ම, බටහිර අධ්‍යාපනය ව්‍යාප්ත වීම 1895 පමණ දක්වා ප්‍රමාද වූයේ පාසල් සඳහා ගාස්තු ගෙවීමට අපහසුතාවත්, පාසල් ගොඩනැගිලි ගැමියන් විසින් ඉදිකළ යුතු බවට තිබූ නියමයත් නිසාදැ යි සොයා බැලීමට උත්සාහ දරා ඇත.

මේ අනුව, මෙම පරිච්ඡේදය මගින් 1850 -1950 දක්වා කුරුණෑගල දිස්ත්‍රික්කයේ පාසල් ව්‍යාප්ත වූ අන්දම ඉහත දක්වා ඇති කරුණු යටතේ විග්‍රහ කිරීමට උත්සාහ දරා ඇත. ඊට පදනම සකස් කරගැනීම සඳහා ඊට පෙර වකවානුව ද දළ විමසීමකට ලක් කර ඇත. මේ සඳහා කුරුණෑගල ආණ්ඩුවේ ඒජන්ත, ප්‍රසිද්ධ ඉගැන්වීම් අධ්‍යක්ෂවරයාගේ පාලන වාර්තා සහ Blue Book සහ පාසල්වල ලොග් සටහන් පොත් ද ප්‍රධාන වශයෙන් මූලාශ්‍ර වශයෙන් උපයෝගි කරගන්නා ලදි.

වර්තමානයේ අධ්‍යාපන අමාත්‍යාංශ මගින් පාසල් ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩ පිළිවෙලක් ආරම්භ කර ඇත. මෙවැනී වැඩ පිළිවෙලක අවශ්‍යතාව මතුවූයේ පාසල් ආරම්භ කිරීම සඳහා මුල් වූ හේතු සාධක හා  ඇති කරගත් පරිපාලන නීති රීති නොසලකා හැර  මහජන ඉල්ලීම් ඉටුකිරීමට නිදහසින් පසු බලයට පැමිණී රජයයන් උත්සාහ දැරීම නිසා ය.  මේ නිසා පාසල් ස්ථාන ගත කිරීම කෙරෙහි බලපෑ සමාජමය හා  ඓතිහාසික සාධක ඊළඟ සිවුවැනි පරිච්ඡේදයේ විස්තර කිරීමට උත්සාහ දරා ඇත. මෙහිදී විශේෂයෙන් අධ්‍යයනය කිරීමට උත්සාහ දරා ඇත්තේ සමාජමය හා ඓතිහාසික සාධකවලට බාහිරව ආගම ව්‍යාප්ත කිරීම සඳහා වූ අවශ්‍යතාවය මිට හේතු වි තිබේද යන කරුණයි. දිස්ත්‍රික්කය තුළ ජනගහණ ව්‍යාප්තිය  නව සංවර්ධන යෝජනා ක්‍රම ක්‍රියාත්මක වීම් හා ප්‍රවාහන  පද්ධතියේ විකාශනය මිට හේතු වි තිබේද?  දුම්රිය මාර්ගය ව්‍යාප්ත විම නිසා යම්කිසි ප්‍රතිඵලයක් ලැබ තිබේ දැ යි සොයා බැලීම අවශ්‍ය ය.

පස්වන පරිච්ඡේදය වෙන් කර ඇත්තේ, අධ්‍යාපනයේ පරිපාලනය විකාශනය වූ අන්දම, විශේෂයෙන් කුරුණෑගල දිස්ත්‍රික්කය ආශ්‍රයෙන් සොයා බැලීම සඳහා ය.  පාසල් කොමිෂන් සභාව, මධ්‍ය පාසල් කොමිෂන් සභාව හා 1869 න් පසු ප්‍රසිද්ධ ඉගැන්වීම් දෙපාර්තමේන්තුව යටතේ පරිපාලන ව්‍යුහය සැකසී තිබූ අන්දමත්,  ආධාර ලබන පාසල් පරිපාලනයේ දි රජය අනුගමනය කළ  පරිපාලන විධිවිධානත් මෙම පරිච්ඡේදයෙන් පරීක්ෂා කර බලනු ලැබේ. අවසාන වශයෙන්, සමාලෝචනයේදී මේ පිළිබඳව  බැස ගත හැකි නිගමනයන් පිළිබඳව පැහැදිලි  කිරීමක් සිදුකර ඇත.